(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක 106.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 ඔක්තෝබර් මස 06 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

142/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2014 මුදල් වර්ෂය තුළ අලාභ ලැබූ රාජ්‍ය ආයතන කවරේද;

(ii) එම ආයතනයන්හි අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් ආයතනයන්ගෙන් වෙනත් රාජ්‍ය ආයතනයන්ට ගෙවීමට ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලාභ පියවීම සඳහා උක්ත ආයතනයන්ට මහා භාණ්ඩාගාරය මඟින් නිකුත් කළ මුදල් ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උක්ත අලාභයන්ට හේතු පිළිබඳ සොයා බැලීමක් කර තිබේද;

(iii) එසේ නම්, එම හේතු එක් එක් ආයතනයට, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) උක්ත ආයතන ලාභදායී ආයතන බවට පත්කිරීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

604/'16

2.

ගරු ලකී ජයවර්ධන මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 1980 අංක 27 දරන විලවුන්, උපකරණ හා ඖෂධ පනත යටතේ ශ්‍රී ලංකාවට විලවුන් ආනයනය කිරීමේදී ඒ සඳහා විලවුන්, උපකරණ හා ඖෂධ නියාමන අධිකාරියේ අනුමතිය ලබා ගත යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) නමුත්, 2015 දී ස්ථාපිත කරන ලද ඖෂධ නියාමන අධිකාරි පනතින් විලවුන් විෂයය ඉවත් කිරීම මඟින් ශරීරයට අහිතකර විලවුන් වර්ග ආනයනය කිරීමට අවස්ථාව හිමි වී ඇති බවත්;

(ii) ශරීරයට අහිතකර එම විලවුන් භාවිතා කරන්නන් විවිධ ආසාත්මිකතාවයන්ට ලක්වී මරණයට සහ රෝගී තත්ත්වයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙවැනි සිදුවීම් අවම කිරීම සඳහා, විලවුන් ආනයනය කිරීම නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් කඩිනමින් සකස් කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

618/'16

3\.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ පිහිටි කෝකිලායි ප්‍රදේශයේ, තිරුඥානසම්බන්ධර් මනිවන්නදාසර් මහතාට අයත් ඉඩමක නීතිවිරෝධී ලෙස බෞද්ධ විහාරයක් ඉදිකරමින් පවතින බව දන්නේද;

(ii) ජනතා විරෝධය විශාල වශයෙන් පැන නැඟී ඇති අවස්ථාවක නීතිවිරෝධීව ඉදිවෙන මෙම විහාරයේ ඉදිකිරීම් කටයුතු වහාම නවතා දැමීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

655/'16

4\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 ජනවාරි 10 දින සිට 2016 අප්‍රේල් 30 දින දක්වා කාල පරිච්ඡේදය තුළ සිය රාජකාරි හෝ පෞද්ගලික ගමන් සඳහා ගුවන් හමුදාව සතු හෙලිකොප්ටර් හෝ ගුවන් යානා යොදා ගත් දේශපාලනඥයන්, රජයේ නිලධාරින් සහ වෙනත් පුද්ගලයන් වෙන් වෙන් වශයෙන් කවුරුන්ද;

(ii) එම ගුවන් ගමන් සඳහා එක් එක් පුද්ගලයාගෙන් අය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගුවන් ගමන් සඳහා අය විය යුතු මුදලින් මෙතෙක් ගෙවා නොමැති මුදල කොපමණද;

(iv) එම හිඟ මුදල් අය කර ගැනීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

672/'16

5\.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා, අමාත්‍යවරයන්, මන්ත්‍රීවරයන් සහ හිටපු ජනාධිපතිවරයන් සඳහා වෙන් කර ඇති කොළඹ නගරය තුළ පිහිටි මුළු නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම නිල නිවාස දැනට භාවිත කරන පුද්ගලයන්ගේ නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iii) මෙම නිල නිවාස වෙන් කිරීම සඳහා අනුගමනය කරන රෙගුලාසි සඳහන් චක්‍රලේඛයක් හෝ ලේඛනයක් තිබේද;

(iv) එසේ නම්, එය සභාගත කරන්නේද;

(v) රෙගුලාසි ලේඛනයක් නොමැති නම්, නිවාස වෙන් කරනු ලබන පටිපාටිය කවරේද;

(vi) නිවාස වෙන් කරනු ලබන රෙගුලාසි හෝ පටිපාටියට අනුව සුදුසුකම් සපුරා නොමැතිව නිවාසවල රැඳී සිටින්නන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

707/'16

6.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රුසියාවේ, ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස උදයංග වීරතුංග මහතා කටයුතු කළ කාලවකවානුව කවරේද;

(ii) ඔහුට එරෙහිව ඇති චෝදනා කවරේද;

(iii) එම චෝදනා සම්බන්ධයෙන් සිදුකර ඇති විමර්ශනවල ප්‍රගතිය කවරේද;

(iv) ඔහුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(v) ඔහුව අත්අඩංගුවට ගැනීම සඳහා ජාත්‍යන්තර පොලිසියේ සහාය ඉල්ලා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

718/'16

7.

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි,

(i) පිහිටි එකම දෙමළ මාධ්‍ය ජාතික පාසල වන අ / සහිරා විද්‍යාලය නොසලකා හැරීම හේතුවෙන් විවිධ අඩුපාඩු සහිත වන බවත්;

(ii) "පාසල් 1000" වැඩසටහනට කාඩාණ්ඩුගම, ජායා මුස්ලිම් මහා විද්‍යාලය හා කහටගස්දිගිලිය මුස්ලිම් මහා විද්‍යාලය ඇතුළත් කර ඇති නමුත් තාක්ෂණ විද්‍යාගාර හැර වෙනත් කිසිදු පහසුකමක් මේ වනවිට ලබා දී නොමැති බවත්;

(iii) සිංහල සහ දෙමළ මාධ්‍ය පාසල්වල ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි සහ තාක්ෂණවේදය වැනි විෂයයන් ඉගැන්වීම සඳහා ගුරු හිඟයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අ (i) හි සඳහන් පාසලෙහි,

(i) උසස් පෙළ විද්‍යා අංශයේ පවතින ගුරු හිඟය සපුරනු ලබන;

(ii) නව ගොඩනැගිල්ලක් ලබා දෙනු ලබන;

(iii) විදුහල්පතිවරයා සඳහා කාර්යාලයක් සහ ශ්‍රවණාගාරයක් ලබා දෙනු ලබන;

(iv) පානීය ජල පිරිපහදු යන්ත්‍රයක් ලබා දෙනු ලබන;

දිනය කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අ (ii) සඳහන් පාසල් සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් ලබාදෙනු ලබන;

(ii) ඉහත අ (iii) හි සඳහන් පුරප්පාඩු පුරවනු ලබන;

දිනය කවරේද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

722/'16

8.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය මැයි මාසයේ ඇති වූ හදිසි ගංවතුර හේතුවෙන් හානියට පත්වූ වගාව සහිත කුඹුරු හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද;

(ii) මෙම හානියෙන් දළ වශයෙන් සිදුවී ඇති පාඩුව කොපමණද;

(iii) හානියට පත් කුඩා වැව් ඇතුළු වාරිමාර්ග සංඛ්‍යාව කොපමණද;

(iv) අලාභ හානි සිදුවූ වාරි ව්‍යාපෘති පිහිටි දිස්ත්‍රික්ක වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදිරි කාලයේදී රටේ ආහාර සුරක්ෂිතතාවය සඳහා මෙම ගංවතුර හානිය බලපාන්නේද;

(ii) විපතට පත් ගොවි ජනතාව වෙනුවෙන් රජය සහන ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

727/'16

9.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රට තුළදී එකලස් කරන ලද, එහෙත් ලියාපදිංචි කර නොමැති වාහන ලියාපදිංචි කිරීමට විශේෂ අවසරයක් 2016 අයවැය යෝජනා මඟින් ලබා දුන් බව පිළිගන්නේද;

(ii) 2016 මාර්තු 31ට පෙර ලියාපදිංචි කරන ලද වෙළඳ වාහන සංඛ්‍යාව සහ එම වාහන ලියාපදිංචි කර ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) රුපියල් මිලියනයක් ගෙවීමෙන් ලියාපදිංචි කරන ලද මෝටර් රථ සංඛ්‍යාව සහ එම මෝටර් රථ ලියාපදිංචි කර ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

731/'16

10.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015.01.09 දිනට,

(i) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් වරාය අනුව ස්ථිර සේවක සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් වරාය අනුව අනියම් සේවක සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016.05.10 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) 2016.05.10 දිනට අධිකාරියට අලුතින් බඳවා ගෙන ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සේවකයන් බඳවාගත් ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

850/'16

11\.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය මගින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ගෙවනු ලබන රු. 2000/-ක දීමනාව ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් කවරේද;

(ii) එම සුදුසුකම් සපුරා ඇති සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට එම දීමනාව ලබා දෙන්නේද;

(iii) මේ සඳහා රජය විසින් 2016 වර්ෂය සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(iv) මෙම දීමනාව ගෙවීමේ බලාපොරොත්තුවෙන් 2015 වර්ෂයේදී කාඩ්පත් නිකුත් කළ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට මෙම දීමනාව හිමිවන දිනය කවරේද;

(v) 2017 වර්ෂයේදී හෝ මෙම දීමනාව ගෙවන සංඛ්‍යාව වැඩිකළ හැකිද;

(vi) දැනට ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ගෙවනු ලබන මෙම දීමනාවෙන් 2016 ජනවාරි මස සිට අයකර ගන්නා ලද රු.100/-ක මුදල කෙදිනක හෝ ඔවුන්ට ප්‍රතිපූරණය කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

851/'16

12\.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බස්නාහිර පළාත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2014.01.01 සිට 2016.06.30 දක්වා කාලය තුළදී පවත්වන ලද සියලු විභාගවලට අදාළව,

(i) එක් එක් විභාගයේ නම;

(ii) එක් එක් විභාගයට අදාළ ප්‍රශ්න පත්‍රවල නම්;

(iii) එක් එක් ප්‍රශ්න පත්‍රයට පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව;

(iv) එක් එක් ප්‍රශ්න පත්‍රය සකස් කළ අයගේ නම් හා තනතුරු නාමයන්;

(v) ප්‍රශ්න පත්‍ර සකස් කිරීම වෙනුවෙන් එක් එක් පුද්ගලයාට ගෙවන ලද මුදල;

(vi) උත්තර පත්‍ර පරීක්ෂා කළ අයගේ නම් හා තනතුරු නාමයන්;

(vii) උත්තර පත්‍ර පරීක්ෂා කිරීම වෙනුවෙන් එක් එක් පුද්ගලයාට ගෙවන ලද මුදල;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

865/'16

13.

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ශ්‍රී ලංගම ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ඩිපෝව මඟින් දිනකට ධාවනය කරනු ලබන බස් රථ සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම ඩිපෝ අතරින් දැනට ලාභ හා පාඩු ලබන ඩිපෝ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංගම ඩිපෝවල සේවය කරන මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(v) බදුල්ල දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංගම ඩිපෝවල වර්තමානයේ පවතින රියදුරු, කොන්දොස්තර, කාර්මික ශිල්පී හිඟය සහ බස්රථ අමතර කොටස් නොමැති වීම යන ගැටලු විසඳා ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

876/'16

14.

ගරු විදුර වික්‍රමනායක මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ, හොරණ සැකසුම් කලාපය පිහිටි ප්‍රදේශයේ, අරුණගම ගම්මානයට යාමට බ්‍රිතාන්‍ය පාලන සමයේ සිට පැවති මාර්ගයේ, ගේට්ටු ඉදිකර ඉබි යතුරු දමා ආරක්ෂක නිලධාරින් රඳවා ඇති බවත්;

(ii) එම ප්‍රදේශයට අදාළව පෙර සැලැස්මේ අදාළ මාර්ගය සටහන් වී ඇතත්, ආයෝජන මණ්ඩලය විසින් අලුතින් සකස් කළ සැලැස්මේ මාර්ගය සටහන් කර නොමැති බවත්;

(iii) එම ප්‍රදේශයේ ගොල්ෆ් ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා මාර්ගය අයත් කොටසද රජය විසින් විකුණා ඇති බවත්;

(iv) කර්මාන්ත සඳහා වෙන්කළ ප්‍රදේශයක ගොල්ෆ් ක්‍රීඩාංගනයක් ඉදිකිරීමෙන් ප්‍රදේශයේ තරුණ තරුණියන්ට රැකියා අහිමි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාර්ගයක් වැටී ඇති ඉඩමක් විකිණීමේ හැකියාවක් තිබේද;

(ii) එම මාර්ගය වසාදැමීමෙන්, ජනතාවට පහසුවෙන් ප්‍රධාන මාර්ගයට ළඟාවිය හැකි මාර්ගයක් අහිමි කිරීම සුදුසුද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, එ මන්ද?

884/'16

15.

ගරු අනුර දිසානායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අ. පො.ස. (උසස් පෙළ) වාණිජ විෂය ධාරාවෙන් විශ්වවිද්‍යාලයට ඇතුල්වීම සඳහා සුදුසුකම් ලබන සිසුන් වෙනුවෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දැනට පවත්වාගෙන යනු ලබන උපාධි පාඨමාලා කවරේද;

(ii) 2014 / 2015 සහ 2015 / 2016 අධ්‍යයන වර්ෂවලදී එකී පාඨමාලා සඳහා බඳවා ගන්නා ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව, පාඨමාලාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ)(ii)හි බඳවා ගත් සිසුන් අතරින් කොළඹ දිස්ත්‍රික්කයෙන් බඳවා ගන්නා ලද;

(i) ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) අවම සුදුසුකම් සහිත ශිෂ්‍යයාගේ "Z" අගය හා දිස්ත්‍රික් කුසලතාව (පාඨමාලාව හා අධ්‍යයන වර්ෂය අනුව);

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අධ්‍යාපන කටයුතු හැර වෙනත් ක්ෂේත්‍රයන්හි විශිෂ්ඨතාවයක් දක්වා ඇති සිසුන් "විශේෂ දක්ෂතා" ගණය යටතේ, විශ්වවිද්‍යාල උපාධි පාඨමාලා සඳහා බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(ii) ඉහත (අ)(i)හි සඳහන් එක් එක් පාඨමාලා සඳහා "විශේෂ දක්ෂතා" යටතේ අදාළ අධ්‍යයන වර්ෂවලදී බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා,— ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නියෝග,— (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඊ) ඡේදය යටතේ 2013 ඉඩම් අත්කර ගැනීමේ (වන්දි ගෙවීමේ) නියෝග සංශෝධනය සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූලි 26 දිනැති අංක 1977/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත යටතේ නියෝග,— 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 වගන්තියේ (2) උප වගන්තියේ (ඇ) සහ (ඉ) ඡේද සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වගන්තිය යටතේ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2016 ජූනි මස 15 දිනැති අංක 1971/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.20 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 1),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1) උප වගන්තියේ (ඕ) (ක) සහ (ඝ) ඡේද යටතේ, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1878/11 සහ 2014 සැප්තැම්බර් 01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*11.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 2),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු 61(1) (ත) වගන්තිය යටතේ, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1878/12 සහ 2014 සැප්තැම්බර් 01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 3),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු 61(1) (ත) වගන්තිය යටතේ, ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1892/41 සහ 2014 දෙසැම්බර් 12 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*13.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 4),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඌ) වගන්තිය යටතේ ස්වදේශ කටයුතු සහ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1904/10 සහ 2015 මාර්තු 03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*14.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 5),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඏ), (ඐ) සහ (ත) වගන්ති යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1907/47 සහ 2015 මාර්තු 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*15.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 6),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඖ) සහ (ත) වගන්ති යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1907/47 සහ 2015 මාර්තු 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*16.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 7),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 30 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1924/6 සහ 2015 ජූලි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*17.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 8),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 29 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1938/2 සහ 2015 ඔක්තෝබර් 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*18.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 9),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1938/2 සහ 2015 ඔක්තෝබර් 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*19.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 10),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14අ, 14ආ, 14ඇ, 14ඈ, 14ඉ, 14ඊ, 14උ, 14ඌ, 14එ, 14ඒ, 14ඔ, 14ඕ, 14ක සහ 14ග වගන්ති සමඟ කියවිය යුතු, 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1945/6 සහ 2015 දෙසැම්බර් 14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*20.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 11),—1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ත) වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1945/7 සහ 2015 දෙසැම්බර් 14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.09.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*21.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*22.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

23.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

24.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

25.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**